2019/29

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2019-07-04

| | | |
|---|---|---|
| පැමිණිලි පාර්ශවය | : | පී. එස්. මද්දුමසූරිය මයා.<br>185/37 1/1. අලකේෂ්වර පාර.<br>ඇතුල්කෝට්ටේ. |
| වගඋත්තරකාර පාර්ශවය | : | 01. ලේකම්.<br>අධ්‍යාපන අමාත්‍යාංශය.<br>ඉසුරුපාය. බත්තරමුල්ල. |
| | | 02. චමනි වික්‍රමතිලක මිය.<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (විනය හා විමර්ශන).<br>අධ්‍යාපන අමාත්‍යාංශය.<br>ඉසුරුපාය. බත්තරමුල්ල. |
| | | 03. විදුහල්පති.<br>ආනන්ද විද්‍යාලය.<br>කොළඹ 10. |
| පැමිණිලි අංකය | : | HRC/3990/17 |

**පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-**

ඉහත පැමිණිලිකරු විසින් 2017-12-22 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, රජයේ ස්ථානමාරු ගණය යටතේ 2017 වර්ෂයේ පළමු ශ්‍රේණියට තම දරුවා ඇතුලත් කිරිමට ඉහත වගඋත්තරකාර විද්‍යාලයට අයදුම්පත්‍රයක් ඉදිරිපත් කල බවත්, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු 95ක් උපයාගෙන පොරොත්තු ලේඛනයේ දෙවන ස්ථානයේ සිටි බවත්, අභියාචනා මණ්ඩලය විසින් රජයේ ස්ථාන මාරු ගණය යටතේ සුදුසුකම් නොමැති දරුවෙක් අවසාන ලේඛනයට ඇතුලත් කර පාසලට ඇතුලත් කිරීමෙන් තමාගේ දරුවාට පාසලට ඇතුලත් වීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත් සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: sechrc@gmail.com

මේ සම්බන්ධව පැමිණිලිකරු විසින් 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව කරන ලද ඉල්ලීමට අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ විභාග ශාඛාව විසින් නිකුත් කර ඇති අංක ED/65/3/1 තො.දැ. හා 2018-01-31 දිනැති තොරතුරු ලබා දීමෙහි ලිපියෙහි 04 වන ඡේදය අනුව ස්ථාන මාරු ගණය යටතේ ඉදිරිපත් වී ඇති එක් දරුවෙකු සඳහා අභියාචනා හා විරෝධතා පරීක්ෂණ මණ්ඩලය විසින් හිමිකම් නොලබන ලකුණු ලබා දීමක් සිදු කර එම දරුවා අවසන් ලේඛනයට ඇතුලත් කරගෙන හෝ ආනන්ද විද්‍යාලයට ඇතුලත් කිරීම මගින් පොරොත්තු ලේඛනයේ සිටින දරුවන්ට අවස්ථාව අහිමි වීමක් සිදු වී ඇති බැවින්. මෙම ගණය යටතේ විද්‍යාලයේ ඇති වන පුරප්පාඩු සඳහා පොරොත්තු ලේඛනයට ප්‍රමුඛතාවය දෙමින් ළමුන් ඇතුලත් කර ගැනීමට කටයුතු කරන ලෙසට විමර්ශන වාර්තාව මගින් නිර්දේශ කර ඇති බව ඉහත කී තොරතුරු ලිපිය මගින් කරුණු තහවුරු වන බව පැමිණිලිකරු කොමිෂන් සභාවට දන්වා ඇත.

**01 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම**–:

පළමු වගඋත්තරකරු නියෝජනය කරමින් පැමිණ සිටින සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ නීතිඥ ප්‍රදීප් නිශාන්ත මහතා කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින ලද්දේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීම සඳහා පූර්ණ බලතල සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා හා විරෝධතා මණ්ඩලයට පවරා ඇති බවත්. අමාත්‍යාංශයට මේ සම්බන්ධයෙන් වගකීමක් නොමැති බවත්ය.

**02 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම** =:

දෙවන වගඋත්තරකරු නියෝජනය කරමින් පැමිණ සිටින ඩබ්.පී. සෙව්වන්දි මිය කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වමින් සඳහන් කර ඇත්තේ, රජයේ ස්ථාන මාරු ගණය යටතේ 2017 වසරේ පළමු ශ්‍රේණියට ළමුන් ඇතුලත් කර ගැනීමේදි සිදු වූ අක්‍රමිතා සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ විනය හා විමර්ශන ඒකකය මගින් විමර්ශනය කිරීමෙන් පසු, සුදුසුකම් නොමැති එම්.බී. සමිරු සස්මිර බලගල්ල (TR 63) යන දරුවා අවසාන ලේඛනයට ඇතුලත් කර පාසලට ඇතුලත් කිරීමෙන් පොරොත්තු ලේඛනයේ මුලටම සිටින දරුවාට අසාධාරණයක් සිදු වූ බවට අනාවරණය බැවින්. මෙම ගණය යටතේ ඇති වූ පුරප්පාඩු පොරොත්තු ලේඛනයට ප්‍රමුඛතාවය ලබා දෙමින් එම ගණය යටතේ ළමුන් ඇතුලත් කිරීමට කටයුතු කරන ලෙසට විදුහල්පතිට උපදෙස් ලබා දී ඇති බව පැමිණි වගඋත්තරකරු කොමිෂන් සභාවට ලේඛනයක් ඉදිරිපත් කරමින් දන්වා ඇත.

**03 වන වගඋත්තරකරුගේ කරුණු දැක්වීම** =:

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරන වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ, සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් පැමිණිලිකරුට කිසිදු අසාධාරණයක් සිදු නොකල බවත්ය. අභියාචනා හා විරෝධතා මණ්ඩලයෙන් සිදු වී ඇති අඩුපාඩුවක්

නිසා පැමිණිලිකරුගේ දරුවා පාසලට ඇතුලත් කර ගැනීමට නොහැකි වී ඇති බව අදාල වගඋත්තරකරු කොමිෂන් සභාවට කරුණු දක්වා ඇත.

**කොමිෂන් සභාව හමුවේ අනාවරණය වූ කරුණු :-**

පැමිණිලිකරුගේ දරුවා 2017 වසරේ පළමු වසරට ඇතුලත් කර ගැනීම සඳහා ස්ථාන මාරු ගණය යටතේ කොළඹ ආනන්ද විද්‍යාලයට අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් පසු ලකුණු 95ක් උපයාගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පාසලට ස්ථාන මාරු ගණය යටතේ දරුවන් 08 දෙනෙකු ඇතුලත් කර ගැනීමට නියමිත අතර, ඉන් එක් දරුවෙක් කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් වීම නිසා පොරොත්තු ලේඛනයේ 01 වන ස්ථානයේ සිටි දරුවා පාසලට ඇතුලත් වූ බවත්, ඉන්පසු මෙම පැමිණිලිකරුගේ දරුවා පොරොත්තු ලේඛනයේ 01 වන ස්ථානයට ඇතුලත් වී ඇති අතර, අභියාචනා මණ්ඩලය විසින් ලකුණු නොමැති දරුවකු වන එම්.බී. සමිරු සස්මිර බලගල්ල (TR 63) දරුවා පාසලට ඇතුලත් කර ගැනීම හේතුවෙන් පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුලත් වීමට තිබූ අවස්ථාව අහිමි වී ඇති බවත් නිරීක්ෂණය වේ.

මේ සම්බන්ධයෙන් දෙවන වගඋත්තර පාර්ශවීය අධ්‍යාපන අමාත්‍යංශයේ (විනය විමර්ශන) ඒකකය මගින් පරීක්ෂණයක් පවත්වා ඇති අතර කොළඹ ආනන්ද විද්‍යාලයේ අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපතිවරයා විසින් නියමිත ලකුණු ප්‍රමාණය ලබා නොමැති දරුවකු වන එම්.බී. සමිරු සස්මිර බලගල්ල දරුවා (TR 63) අවසාන ලේඛනයට ඇතුලත් කිරීම නිසා පොරොත්තු ලේඛනයේ සිටි දරුවන්ට අසාධාරණයක් සිදු වී ඇති බව විමර්ශන වාර්තාවේ දක්වා ඇත.

**නිගමනය හා නිර්දේශය :-**

පැමිණිලිකරුගේ දරුවා 2017 වසරේ පළමු වසරට කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා රජයේ ස්ථාන මාරු ගණය යටතේ සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වීමෙන් ලකුණු 95ක් හිමි කර ගෙන පොරොත්තු ලේඛනයේ 02 වන ස්ථානය ලැබී ඇති අතර, පසුව පොරොත්තු ලේඛනයේ 01 ස්ථානයේ සිටි දරුවා වෙනත් පාසලකට යාම හේතුවෙන් පැමිණිලිකාරියගේ දරුවා 01 ස්ථානයට

පත්ව සිටි නමුත් අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපතිවරයා විසින් ලකුණු නොමැති එම්.බී. සමිරු සස්මිර බලගල්ල (TR 63) අවසාන ලේඛනයට ඇතුලත් කර පාසලට ඇතුලත් කිරීම මත පැමිණිලිකරුගේ දරුවාට පාසලට ඇතුලත් වීමට තිබූ අවස්ථාව අභියාචනා හා විරෝධතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අත්තනෝමතික ක්‍රියාකලාපය හේතුවෙන් අහිමි වී ඇති බවට කොමිෂන් සභාව හමුවේ නිරීක්ෂණය වේ.

එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවට මෙම පරීක්ෂණයෙන් අනතුරුව නිගමනය කරනු ලැබේ.

නිර්දේශය –:

01. ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන සදෙව් කල්හාර මද්දුමසූරිය දරුවා කොළඹ ආනන්ද විද්‍යාලයේ 03 වන ශ්‍රේණියට ඇතුලත් කර ගැනීමට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

02. අභියාචනා කමිටුවේ සභාපති වන කැළණිය ගුරුකුල විද්‍යාලයේ විදුහල්පති අමිරු ගීතලාල් අබේගුණවර්ධන යන අයගේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් විනය පියවර ගෙන කොමිෂන් සභාව වෙත වාර්තා කිරීමට ලේකම් අධ්‍යාපන අමාත්‍යංශය විසින් කටයුතු කළ යුතුය.

2019.08.05 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. අමිරු ගීතලාල් අබේගුණවර්ධන මයා
   සභාපති - ආනන්ද විද්‍යාලයීය අභියාචනා කමිටුව
   කැළණිය ගුරුකුල විද්‍යාලය.

2. අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් මහතා
   අධ්‍යාපන අමාත්‍යංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/